# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

**ශ්‍රේණිය :-** 8 ශ්‍රේණිය

**වාරය :-** දෙවන වාරය

**නිපුණතා මට්ටම 6.3:** විවිධ ජනවර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.3 :** නවරාත්‍රී උත්සවය හඳුනා ගනිමු.



සැකසුම: එච්. ඒ. ලලන්තිකා ජයසිංහ

මහ/වත්/ලියන්ගස්වගුර ආදර්ශ කනිෂ්ට විදුහල

පන්විල

මෙහෙයවීම: නර්තන අංශය

වත්තේගම අධ්‍යාපන කලාපය

උපදෙස්: මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩි දුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසැල් ගුරු ඇසුර ලබාගත යුතුය.

## හැඳින්වීම

ඔබ මේ වන විට 6 ශ්‍රේණියේදී සහ 7 ශ්‍රේණියේදී විවිධ ජනවර්ග හා සබැඳි සංස්කෘතික උත්සව යන මාතෘකාව යටතේ තෛපොංගල් උත්සවය,වෙසක් උත්සවය, නත්තල් උත්සවය සහ රාමසාන් උත්සවය පිළිබඳ කරුණු හදාරන්නට ඇත.

මෙම පාඩමෙන් අප බලාපොරොත්තු වන්නේ **හින්දු ප්‍රධාන ආගමික උත්සවයක් වන නවරාත්‍රී උත්සවය** පිළිබඳ තොරතුරු විමසා බැලීමටය.

මෙහිදී එම උත්සවය හා සම්බන්ධ ආගමික පසුබිම, පැවැත්වීමට හේතු සහ උත්සවය හා බැඳී කලාත්මක අංග ආදිය පිළිබඳ නිසි අවබෝධයක් ඔබට ලබාගත හැක.



# නවරාත්‍රී උත්සවය

ද්‍රවිඩ ජනයා විසින් පවත්වන උත්සව අතර ඉතාම උසස්, හින්දු ආගමික උත්සවයක් ලෙස නවරාත්‍රී උත්සවය හඳුන්වා දිය හැක. පුරා දින 9ක් රාත්‍රී භාගයේ දෙවියන් සඳහා උත්සව පවත්වන හෙයින් මෙය “නවරාත්‍රී” උත්සවය ලෙස නම් කර ඇත.

## පැවැත්වීමට හේතු :-

- දෙවියන් පිදීම
- සශ්‍රිකත්වය හා සෞභාග්‍යය ප්‍රාර්ථනා කිරීම
- අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම



## පවත්වන කාලය :-

අස්වනු නෙලන කාලය මේ සඳහා යොදා ගනිති.

# ආගමික පසුබිම සහ චාරිත්‍ර විධි :-

නවරාත්‍රී උත්සවයේදී ප්‍රධාන ලෙස කාන්තා දෙවිවරු තිදෙනෙක් පුද ලබති.

1. දුර්ගා දේවිය
2. ලක්ෂ්මී දේවිය
3. සරස්වතී දේවිය



- ප්‍රථම දින තුන (3) **දුර්ගා දේවිය** සදහා පුජා පැවැත්වේ. ඇය විටෙක " කාලි අම්මාන් " සහ " පාර්වතී " ලෙසත් මෙම උත්සවයේදී පුද ලබන්නිය. ඇය **බලයට හා ශක්තියට අධිපති** බැවින් මෙම ශක්තිය හා බලය ජනතාවට ලබා දෙන්නට යැයි පතමින් පුජා පවත්වති.

- හතර වන දිනයේ (4) සිට හයවන දිනය (6) දක්වා දින තුනක් **ධනයට හා සමෘද්ධියට අධිපති ලක්ෂ්මී දේවියට** එම ධනය හා සමෘද්ධිය ලබා ගැනීමේ දැඩි අපේක්ෂාවෙන් පුජා පවත්වනු ලබති.

- හත්වන දිනයේ (7) සිට නවවන දිනය (9) දක්වා දින 3ක් පුජා පවත්වන්නේ **කලාවට අධිපති** දේවිය ලෙස සැලකෙන **සරස්වතී දේවිය** උදෙසා ශාස්ත්‍ර කලා දියුණුව මුදුන් පමුණුවා ගැනීම අපේක්ෂාවෙනි.

## විශේෂ චාරිත්‍ර :-

❖ උත්සවය පැවැත්වූ ප්‍රථම දින 9 අවසානයේ 10 වන දින **"විජය දසම්"** නම් පූජාවක් පැවැත්වේ. මෙය විද්‍යාවේ ආරම්භය ලෙස ද්‍රවිඩ ජනයා සලකනු ලබන අතර අවුරුදු 03න් පහළ කුඩා දරුවන්ට ප්‍රථමයෙන් අකුරු කියවීම ආරම්භ කිරීමේ චාරිත්‍රය එදින සිදු කෙරේ.



**මෙහිදී තැටියක් මතට හාල් දමා ඒ මත "අ" අකුර ලියා එය ප්‍රථමයෙන් ඉගැන්වීම සිදුකෙරේ.**

❖ **නවරාත්‍රී දින රාත්‍රී පූජාව පවත්වන අවස්ථාවේ තම රැකියාවට අදාළ උපකරණ අතේ තබාගෙන පූජා පැවැත්වීම තවත් විශේෂ චාරිත්‍රයකි.**
නිදසුනක් ලෙස අධ්‍යාපනය ලබන්නන් පැන්සල්, පොත් ආදිය රැගෙන පූජාව පවත්වති.

## උත්සවය හා සම්බන්ධ කලාංග :-

**නර්තන අවස්ථා :**

- **මෙයට අවේණික වූ විශේෂ නර්තන අංග නොමැති අතර ද්‍රවිඩ ජනයාට ආවේණික වූ නර්තන අංග භාවිත කරනු ලැබේ.**

උදාහරණ ලෙස කෝලාට්ටම් , වෙම්බු , භරත නාට්‍යම් , සතුට ප්‍රකාශ කෙරෙන කැරකීම් සහිත නර්තන අංගයන් සහ පහන් රැගත් දේවල ආශ්‍රිතව කෙරෙන නර්තන අංගද පවත්වනු ලබති.




**ගායන අවස්ථා :**

- **දෙවියන් උදෙසා "තේවාරම්"** නම් විශේෂ ගායනාවන්ද **" සකල කලා වෙල්ලිමාලෙයි "** නම් ගායනාවක්ද සිදු කරති.

**වාදන අවස්ථා :**

- කෝවිල් වාදනයට **තවිල් බෙරය** යොදා ගන්නා අතර ස්තෝත්‍ර ගායනා සමග සුවිශේෂ පද කොටස් වාදනය කෙරේ.
- **සංඛ ( හක්ගෙඩි ) පිඹීම**ද දැකිය හැක.





## උත්සවය හා සම්බන්ධ සැරසිලි :-

**මෙහි සැරසිලි කොටස් 2කට අනුව හදුනා ගත හැක.**

1. **පළමු කොටස : හින්දු කෝවිල් සරසා ගැනීම**

   මේ සදහා කෙසෙල් ගස් සහ කෙසෙල් කැන් යොදා ගනු ලැබේ. තවද කෝලම් සැරසිලි සහ පහන් වලින්ද කෝවිල් ඇතුලත සරසනු ලැබේ.




2. **දෙවන කොටස : තම නිවෙස් සරසා ගැනීම**

   **කෝලම් සැරසිලි මෙන්ම පහන් වලින් සැරසීම සිදු කරන අතර ප්‍රධාන සැරසිල්ල වන්නේ " කොලු " නමින් හදුන්වන තට්ටු 9 කින් යුත් ආසනයකි. මෙම තට්ටු දේව රූප සහ සෙල්ලම් බඩු වලින් අලංකාර කරගනු ලැබේ. මෙහි අවසන් තට්ටුව ඇට වර්ග 9ක් පැළ වන්නට තබා එයින් සරසා ගනු ලබති.**

